# මහවැලි ජනාවාසයන්හි සේවා පහසුකම් ස්ථානගත කිරීම: ගිරාඳුරුකෝට්ටේ නගර මධ්‍යස්ථානයන්හි කාර්යමය වැදගත්කම[1].

ලාල් මර්වින් ධර්මසිරි


## සාරාංශය

සැලසුම්ගත ප්‍රවේශයක් යටතේ ඉදිකරන ලද මහවැලි 'සී' කලාපයේ ජනාවාස ධුරාවලියේ කාර්යමය දායකත්වය පිළිබඳ ව මේ ලිපියෙන් අවධාරණය කෙරේ. න්‍යායාත්මක ව කෙතරම් තාර්කික වුව ද ප්‍රායෝගික ව ගත් කල එහි පවත්නා අසංවිධිත බව හඳුනා ගැනීමට මේ පර්යේෂණයෙන් උත්සාහ දරා ඇත. කෘෂිකාර්මික පරිසරයක වෙසෙන ප්‍රජාවගේ අවශ්‍යතා, රුචි අරුචිකම් හා ආකල්ප හඳුනාගෙන හැකිතාක් දුරට ඒවාට අනුරූප වන පරිදි සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාමත්, ඒවායේ කාර්යමය දායකත්වය ප්‍රශස්ථ අන්දමින් පවත්වාගෙන යාමට ගතයුතු පිළියම් පිළිබඳවත් මේ ලිපියෙන් අවධාරණය කෙරේ.


## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා ක්‍රම අතුරින් ප්‍රමුඛස්ථානයක් මහවැලි යෝජනා ක්‍රමයට හිමිවේ. ඊට ප්‍රධාන හේතුව දිවයිනෙහි විශාල ප්‍රමාණයක් එයට අයත් වීම යි. මහවැලි යෝජනා ක්‍රමයට අයත් වන භූමි ප්‍රදේශය අක්කර මිලියන 6.33 (හෙක්ටයාර් මිලියන 2.53) පමණ වෙයි. එය මුළු වියළි කලාපීය භූමියෙන් 55% ක් ද, මුළු දිවයිනෙන් 39%ක් තරම් වූ ප්‍රමාණයකි (Mendis 1973). මහවැලි සංවර්ධන ව්‍යාපාරය මෙරටේ ඇතිකරන ලද්දේ මූලික වශයෙන් කෘෂි නිෂ්පාදිතය වර්ධනය කිරීම මගින් ගොවි ජනතාවගේ ආදායම වැඩි කිරීමටත්, ඒ මගින් ඔවුන්ගේ ජීවන තත්ත්වය

[1] 1995 වසරේ දී කැළණිය විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරන ලද පර්යේෂණ වාර්තාවක් ඇසුරෙන් මේ ලිපිය සකසා ඇත. මේ ලිපියේ අඩංගු ඇතැම් දත්ත 2002 වසරේ දී යාවත්කාලීන කර ඇත.

හැංචාලීමටත්, ජනපදිකයන් තුළ සමානාත්මතාවයක් ඇති කිරීමටත්, මූලික වශයෙන් සමාජ පශුතලයක් හා කෘෂිකාර්මික ව්‍යාප්ති හා ආධාරක සේවාවන් ලබාදීමෙන්, සහෝදිය වශයෙන් සංසක්ත වූත්, ආර්ථික වශයෙන් ක්‍රියාකාරීවූත් ජනාවාස ඇරඹීමට ය(M.D.B. and Sogreach 1972: මහවැලි සංවර්ධන අමාත්‍යාංශය 1983).

මෙලෙස පිහිටුවනු ලැබූ නව ජනාවාස සැලසුම් රටාව කලාපයේ සංවර්ධනය තීව්‍ර කිරීමට කෙතෙක් දුරට හේතු වී තිබේ ද යන්න සලකා බැලීම මේ අධ්‍යයනයේ මූලික පරමාර්ථය යි. එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පහත දැක්වෙන ක්ෂේත්‍රයන් කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

1 නව ධූරාවලියක් යටතේ නිර්මාණය කරන ලද සේවා මධ්‍යස්ථාන ස්ථානගත කිරීම උක්ත කාර්යය සාක්ෂාත් කරගැනීමට කොතෙක් දුරට දායක වී තිබේද යන්න සොයා බැලීම.

2 සැලසුම් රටාවේ කිසියම් දුර්වලතාවයක් හඳුනාගතහොත් වඩාත් කාර්යක්ෂම සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

## ක්‍රමවේදය

අධ්‍යයනයට සෘජු ව ම හෝ වක්‍ර ව අදාළ පොත් පත් ලිපි ලේඛන, වාර්තා සහ සිතියම් පරිශීලනය කිරීමෙන් අධ්‍යයනයට මනා පසුබිමක් සපයා ගෙන ඇත. අධ්‍යයන අරමුණු සපුරා ගැනීම සඳහා මහවැලි "සී" කලාපයේ ගිරාඳුරුකෝට්ටේ නගරය පෝෂක ප්‍රදේශය ලෙසට ද, දෙවන සහ තෙවන උප කලාප අතරින් ජනපද 6 ක් ස්තෘත නියැදියකට (Stratified Sample) අනුව තෝරාගෙන ඇත. ගම්මාන තෝරා ගැනීමේ දී ගිරාඳුරුකෝට්ටේ නගරය කේන්ද්‍ර කොටගෙන කිලෝමීටර් 4 ක අරයක් තුළ පිහිටි ජනාවාස තෝරාගෙන නොමැත. ඊට හේතුව එම සීමාව තුළ වෙසෙන ජානපදිකයින්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට ගිරාඳුරුකෝට්ටේ නගරයට පැමිණෙන්නේ යැයි අභිඋපගමනයකොට (නියැදි

සමීක්ෂණයේ දී ලද තොරතුරුවලට අනුව) තිබීම යි. මේ අනුව, විරාණගම, මොරවලාවල , තෙල්දෙනියාය, දියවිදාගම, දිවුලපැලැස්ස, ගල්පෝරුයාය සහ බතලයාය යන ගම්මාන නියෝජනය වන අයුරින් එක් ජනපදයකින් 25 දෙනෙකු බැගින් වනසේ, සසම්භාවී ලෙස (Random Sample) කුටුම්භයකින් තෝරාගෙන, ඔවුන් නවන ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කොට, දත්ත ඒකරාශී කොටගෙන තිබේ. එසේ ම, අධ්‍යයනය සිදුකළ කාලවකවානුවේ දී හිරාදුරුකෝට්ටේ නගරයේ ව්‍යාප්ත ව පැවති වෙළඳසැල් 52 අතුරින්, ඒවායේ කාර්යමය සංයුතියට අනුකූලව ස්තෘත නියදියක් සදහම් කොටගෙන, වෙළඳසැල් 12 ක් සමීක්ෂණයට භාජනය කොට ඇත.

## න්‍යායාත්මක පසුබිම

ජනාවාස ස්ථානගත වීමේ අවකාශීය රටාව පිළිබඳ ව ප්‍රථමයෙන් ම වස්තු බීජයක් ලබාදුන් තැනැත්තා ලෙසට දැක්විය හැක්කේ ෆොන් තූනන් ය(Von Thunen). ඔහුගේ "හුදෙකලා රාජ්‍යය" නමැති ග්‍රන්ථයේ අභිඋපගමනයන් කිහිපයක් පදනම් කරගෙන ජනාවාස ආරම්භ වීම පිළිබඳවත්, භූමි පරිභෝග රටාවට අනුව ක්‍රමයෙන් නගර වර්ධනය වීම පිළිබඳවත් අදහස් දක්වා ඇත (Morgan and Plugh 1971). මේ අදහස තව දුරටත් 1959 දී ග්‍රෝතේවෝල්ඩ් (Grotewald)" 1962 දී චිසෝල්ම් (Chisholm) සහ 1966 දී හෝල් (Hall) විසින් පුනරීක්ෂණයකට භාජනය කර ඇති අතර මේ අදහස ස්ථානගත වීමේ සාමාන්‍ය න්‍යායක් ලෙසට දැක්විය නො හැකි වුවත්, විශ්ලේෂණ ක්‍රමයක් ලෙසට යොදාගත හැකි බව ඔහු විසින් වැඩි දුරටත් දක්වා ඇත (Berry 1976). 1933 දී සේවා මධ්‍යස්ථානවල අවකාශීය ව්‍යාප්තිය පිළිබඳ ව නව සංකල්පයක් ක්‍රිස්ටාලර් (Christaller) "මධ්‍යයම කේන්ද්‍රගත න්‍යාය" මගින් ඉදිරිපත් කර ඇත. මේ අදහස් පසුකාලයේ විද්වතුන් බොහොමයක් විසින් සාකච්ඡාවට භාජනය කොට ඇත ( Hagget 1979). ඒ අතුරින් 1954 දී ලොෂ්ච් (Losch) සහ 1962 දී ඉසාඩ් (Isard) විසින් මධ්‍යම කේන්ද්‍රගත න්‍යාය තව දුරටත් ක්‍රමවත්ව සැකසීමට වෙර දරා ඇත. 1965 දී බෙරි

සහ ප්‍රෙඩ් (Berry and Pred) විසින් මධ්‍යම කේන්ද්‍රගත න්‍යාය පිළිබඳ ව පැහැදිලි සාක්ෂි සැපයීමට ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියක් සකසා ඇත. 1953 දී බර්ෂ් සහ බ්‍රෙසි (Bursh and Breacy ) විසින් ද මධ්‍යම කේන්ද්‍රය සහ දුර ප්‍රමාණය මත ධුරාවලියේ අවකාශීය සබඳතාව පැහැදිලි කොට තිබේ. එසේ ම ස්ටැෆර්ඩ් විසින් කුඩා නගරවල ජනසංඛ්‍යා ප්‍රමාණය සහ කාර්යයන් අතර ක්‍රියාත්මක සබඳතාව හඳුනා ගෙන තිබේ. බෙරි (1967-Berry) විසින් සේවා මධ්‍යස්ථාන කාණ්ඩ ලෙස කුඩා ගම්මාන ගම්, නගර, අගනගර සහ ප්‍රාදේශීය නගර වශයෙන් තෝරාගෙන අලෙවිය හා වෙළඳපොළ ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කර තිබේ (Berry 1967).

## මහවැලි "සී" කලාපයේ ජනාවාස රටාව

මහවැලි සංවර්ධන ව්‍යාපාරය විශාල යෝජනා ක්‍රමයක් වන හෙයින් සංවර්ධන කටයුතු ඇරඹීමේදී කුඩා කලාප 13 කට බෙදා ඒවා A,B,C,D යනාදි වශයෙන් ක්‍රියාවට නංවා ඇත. මේ අතුරින් මහවැලි "සී" කලාපයේ සංවර්ධන කටයුතු 1978 දී ඇරඹී තිබේ. ඊට හෙක්ටයාර් 69,150 ක් නැතහොත් මහවැලි සංවර්ධන ව්‍යාපාරයට අයත් වන භූමියෙන් 24% ක් පමණ අයත්වෙයි. "සී" කලාපයේ ජනාවාස රටාව සඳහා ද "පොකුරු" (Clustered) රටාව මත ගෙවතු සහ නිවාස සඳහා උස් භූමියත්, පහත් භූමිය (ජල සම්පාදිත) කුඹුරු සඳහාත් වශයෙන් සකස් කොට ඇත (බලන්න: අංක 1-අ, ආ සහ ඇ සිතියම්).

මහවැලි ව්‍යාපාරයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා නව සංවර්ධන ප්‍රදේශය තුළ වඩා හොඳ සම්බන්ධීකරණයක් ඇතිකිරීම පිණිස සැලසුම් නිර්මාපකයන් විසින්, විශේෂයෙන් ම ප්‍රංශයේ සොග්‍රියා (Sogreach) ආයතනයේ උපදේශකයන් විසින් සේවා මධ්‍යස්ථාන (Service Centres), ධුරාවලින් (Hierarchy) කීපයක් යටතේ පිහිටුවා ඇත (මහවැලි සංවර්ධන අමාත්‍යාංශය, 1993). ඒවා කුඩා ගම්මාන (Hamlet), ගම් මධ්‍යස්ථාන (Village Centre),

ප්‍රාදේශීය මධ්‍යස්ථාන(Area Centre) සහ නගර මධ්‍යස්ථාන (Township) වශයෙනි. කුඩා ගම්මානයක් හෙවත් උප ජනාවාසයක ගොවි පවුල් 800 - 1000 ත් අතර ප්‍රමාණයක් ද, ප්‍රාදේශීය මධ්‍යස්ථාන සඳහා පවුල් 5000-* 8000 ත් වශයෙන් ද පදිංචි කෙරිණි. එලෙස පදිංචි කළ ජානපදිකයිනට මහවැලි ජනාවාස හා ඉඩම් පාරිභෝගික ප්‍රතිපත්තිය යටතේ පවුලකට ලබා දුන් ඉඩම් ප්‍රමාණය වන්නේ ගොඩ ඉඩම් හෙක්ටයාර් 0.2 ක් සහ වී වගාව සඳහා මඩින් හෙක්ටයාර් 1 කි (මහවැලි සංවර්ධන අමාත්‍යාංශය 1988).

මහවැලි "සී" කලාපය පරිපාලනමය වශයෙන් වාරිමාර්ග රටාව සහ භෞතික පසුබිම් පදනම් කොටගෙන කුඩා ඒකකවලට බෙදා ඇත. එය උප කලාප 6 ක් ද, නාගරික මධ්‍යස්ථාන 2 ක් ද, ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9 ක් ද, ගම්මාන 19 ක් සහ කුඩා ගම්මාන 61 ක් ද, වශයෙන් බෙදා දක්වා ඇත (අංක 2 සිතියම). මේ අධ්‍යයනය සඳහා කේන්ද්‍ර කොට ගන්නා ලද ගිරාඳුරුකෝට්ටේ නගර මධ්‍යස්ථානය යටතේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 3 ක්, ගම් මධ්‍යස්ථාන 6 ක් සහ කුඩා ගම්මාන 19 ක් ද පවතී. මහවැලි "සී" කලාපයේ දෙවන සහ තෙවන උප කලාපවල පවතින ඉඩම් ප්‍රමාණය සහ දැනට පදිංචි කරවා ඇති ගොවිපළවල් පිළිබඳ ව විස්තර අංක 1 දරන වගුවෙන් පැහැදිලි කෙරේ.

ජනාවාස සැලසුම්කරණය සේවා පහසුකම් සැපයීම සමග බැදී පවතී. ඒ අනුව ජානපදිකයින් සඳහා අධ්‍යාපනය, සෞඛ්‍යය, තොරතුරු හුවමාරුව සහ ගමනාගමනය, වෙළඳ සේවා ආදි විවිධ වූ සේවාවලින් රාශියක් ජන සංඛ්‍යාව හා දුර යන නිනුම් දඬු මත සැලසුම් කිරීම සහ ස්ථානගත කිරීම සිදුකොට තිබේ. ඒ යටතේ මූලික කරුණු තුනක් අවධාරණය කොට තිබේ.

1. සේවා පහසුකම් උපරිම වශයෙන් ජානපදිකයින්ට සමීප වන අයුරින් ව්‍යාප්ත කිරීම.
2. සේවා පහසුකම් සැපයීමේ දී ආර්ථික වශයෙන් කාර්යක්ෂමවත්, සැපයෙන සේවා ලාභදායී ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන අවම

ජනසංඛ්‍යා ප්‍රමාණයක් සැළකිය යුතු දුරක් තුළ දී සංගිත කිරීම.

3. සමාන මට්ටමින් ක්‍රියාත්මක වන සියලුම සේවා සහ පහසුකම් එක් සේවා මධ්‍යස්ථානයකට කේන්ද්‍රගත කිරීම.

මේ අනුව එක් එක් ධූරාවලින් යටතේ සේවා හා පහසුකම් ස්ථානගත කරන ආකාරය දක්වා තිබේ (වගු අංක 2. සේවා මධ්‍යස්ථාන පිළිබඳ ව ධූරාවලිය).

1. වගුව දෙවන සහ තෙවන උප කලාපවල පසුබිම් තොරතුරු

| උප කලාපය | කොට්ඨාස අංකය | මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්.) | වගා කළහැකි මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්.) | ගොවි පවුල් ප්‍රමාණය | කෘෂි නොවන කටයුතු සඳහා පදිංචි [illegible] | මුළු ගොවි පවුල් |
|---|---|---|---|---|---|---|
| දෙවන උප කලාපය | 201 | 1013 | 592 | 592 | 118 | 710 |
| | 202 | 2876 | 999 | 999 | 200 | 1199 |
| | 203 | 1522 | 776 | 776 | 151 | 931 |
| | 204 | 2273 | 754 | 754 | 215 | 905 |
| | 205 | 2898 | 1074 | 1074 | 174 | 1289 |
| | 206 | 1629 | 869 | 869 | 101 | 1043 |
| තෙවන උප කලාපය | 301 | 537 | 336 | 336 | 101 | 437 |
| | 302 | 903 | 759 | 759 | 75 | 834 |
| | 030 | 771 | 411 | 411 | 124 | 535 |
| | 034 | 1069 | 619 | 619 | 186 | 805 |
| | 305 | 1313 | 757 | 757 | 229 | 986 |
| එකතුව | | 16804 | 7946 | 7946 | 1728 | 9674 |

මූලාශ්‍රය: ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාස කළමණාකාර කාර්යාලයේ ඇති දත්ත

2. වගුව සේවා මධ්‍යස්ථාන පිළිබඳ ධුරාවලිය

| සේවාවල ස්වභාවය | කුඩා ගම්මාන (පවුල් 250) | ගම්මාන ප්‍රාදේශීය මධ්‍යස්ථාන (පවුල් 800-1000) | නගර මධ්‍යස්ථාන (පවුල් 4000) |
| --- | --- | --- | --- |
| පරිපාලනය | ඒකක කළමණාකරු | ව්‍යාපෘති කාර්යාලය. | ව්‍යාපෘති කාර්යාලය, නගර සභා, පොලිසිය. |
| වෙළඳ | තැපැල් පෙට්ටි, සිල්ලර වෙළඳ සැල්, සමුපකාරය | උපතැපැල් කාර්යාලය වෙළඳසැල්, පොළ[1], ග්‍රාමීය බැංකු | තැපැල්හල, වෙළඳසැල්, සමුපකාරය, බැංකු, ඉන්ධන පිරවුම් හල්, සිනමා ශාලාව |
| කෘෂිකාර්මික | කෘෂිකාර්මික යෙදවුම්/පොහොර, බීජ | බීජ අලෙවිසැල්, බීජ ගබඩා, කෘෂි උපකරණ අලුත්වැඩියා කරන ස්ථාන | කෘෂිකාර්මික යෙදවුම් අලෙවිසැල් |
| අධ්‍යාපන | ප්‍රාථමික පාඨශාලා | ප්‍රාථමික/ද්විතීයික පාඨශාලා | ද්විතීයික පාඨශාලා |
| සෞඛ්‍යය | ස්වේච්ඡා සෞඛ්‍ය සේවකයින් | රජයේ බෙහෙත් ශාලාව | ආරෝග්‍ය ශාලාව |
| කාර්මික | -- | ගෘහ කර්මාන්ත | වී මෝල, අපනයන කෘෂිකර්ම ද්‍රව්‍ය පදනම් කරගත් |
| සංස්කෘතික | ආගමික මධ්‍යස්ථාන | පූජා ශාලාව, ආගමික මධ්‍යස්ථාන | ප්‍රධාන ආගමික මධ්‍යස්ථාන |

මූලාශ්‍රය : Mahaweli Authority of Sri Lanka (1980) Implementation Plan for Zone 2 of system 'C', Table 3.1

[1] ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පමණක් ස්ථානගත කර ඇත.

## සේවා මධ්‍යස්ථාන ඇගයීම

ඕනෑ ම සේවාවක් පවත්වාගෙන යාම සඳහා මූලික වශයෙන් ප්‍රශස්ත ජන සංඛ්‍යාවක් සිටිය යුතු අතර ම, එය පවත්වාගෙන යාම පිණිස ප්‍රමාණවත් ආර්ථික කටයුතු සිදුවීම ද අත්‍යාවශ්‍ය ය. ගිරාඳුරුකෝට්ටේ නගරයේ ඇති සේවාවන් පවත්වාගෙන යාම සඳහාත් මේ මූල ධර්මය වැදගත් වෙයි. මේ තත්ත්වය විමර්ශනය කිරීමේ දී සාධක කීපයක් යටතේ සොයා බැලිය හැකි ය. ඒවානම්,

1. ජන සංඛ්‍යා සාධක
2. ආර්ථික සාධක
3. වෙළඳපොළ සාධක
4. ප්‍රවාහන සාධක

## ජනසංඛ්‍යා සාධක

අධ්‍යයනයට අදාළ වූ ගම්මානවල ගොවි පවුලක් ලෙසට සලකා ඇත්තේ, ඉඩම්ලාභී ගොවි පවුල් ය. එහෙත් බොහෝ ගොවි පවුල්වලට සම්බන්ධ වූ අනු පවුල් පැවතීම "සී" කලාපයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. සමීක්ෂණයට භාජනය කළ ගොවි පවුල්වල සාමාජිකයින් ලෙසට අනු පවුල් තව දුරටත් සැලකීම මත ප්‍රදේශයේ එක් ගොවි පවුලක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 6 ක් (5.8) වැනි ඉහල අගයක් ගෙන ඇත. මෙහි දී අනු පවුල් ලෙසට විග්‍රහ කෙරෙනුයේ විවාහ වී වෙනම ම ඒකකයක් ලෙසට කටයුතු කරන පවුල්වලට යි. පහත දැක්වෙන වගුව මගින් ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රදේශයේ ජන සංඛ්‍යා දත්ත ඉදිරිපත් කෙරේ.

3. වගුව

අධ්‍යයන ප්‍රදේශයේ ජන සංඛ්‍යා දත්ත

| ඒකකය | ගොවි පවුල් ප්‍රමාණය[3] | අනු පවුල් ප්‍රමාණය[4] | එකතුව | එක් පවුලක සිටින සාමාන්‍ය ප්‍රමාණය[5] |
|---|---|---|---|---|
| 1. වීරාණගම | 242 | 45 | 287 | 6.3 |
| 2. ගල්පෝරුයාය | 224 | 50 | 274 | 5.5 |
| 3. පොලාවල | 236 | 21 | 257 | 6.0 |
| 4. කෙල්ඇඳිනියාය | 205 | 102 | 307 | 6.4 |
| 5. දියවිද්දාගම | 194 | 18 | 212 | 5.6 |
| 6. ඕකලයාය | 201 | 116 | 317 | 5.8 |
| 7. දිවුලපැලැස්ස | 275 | -- | 275 | 4.8 |
| එකතුව | 1577 | 352 | 1929 | 5.8 |

සේවා මධ්‍යස්ථානවල පැවැත්ම සඳහා ජන සංඛ්‍යා ප්‍රමාණය මූලික වශයෙන් බලපා යි. හිරාඳුරුකෝට්ටේ නගර මධ්‍යස්ථානයෙන් සේවය සැපයෙන මුලු ගොවිපවුල් ප්‍රමාණය 9674 ක් පමණ වෙන අතර, ගොවි පවුලක සාමාන්‍යය ජනසංඛ්‍යා ප්‍රමාණයෙන් ගුණ කිරීමේ දී දෙවන සහ තෙවන උප කලාපවල ජන සංඛ්‍යා ප්‍රමාණය 50,000 කට නො අඩුවන බැව් පැහැදිලි වෙයි.

## ආර්ථික සාධක

අධ්‍යයන ප්‍රදේශයේ වෙසෙන ජානපදිකයින් බහුතරයකගේ ආර්ථික ක්‍රියා කාරකම් සියල්ල කෘෂිකර්මාන්තය මත රඳා පවතී. සෑම කුටුම්භ ඒකකයක් සතුව ම ඒකාකාර ඉඩම් අයිතියක් පැවතීම, කලාපයේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම්හි ඒකීයත්වයක් පැවතීමට හේතු වී ඇත. එහෙත් ගොවීන් සතු

[3] හිරාඳුරුකෝට්ටේ කොට්ඨාශ කළමනාකාර කාර්යාලයේ ඇති දත්ත
[4] හිරාඳුරුකෝට්ටේ කොට්ඨාශ කළමනාකාර කාර්යාලයේ ඇති දත්ත
[5] ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත

ශිල්පක්‍රම, හැකියාවන්, මූල්‍ය ශක්තිය, දැනීම සහ වෙනත් හේතූන් මත ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රමාණය තුළ විවිධත්වයක් දැකිය හැකි ය. හෙක්ටයාර් 1 ක භූමිය තුළ වී වගාව සඳහා වැයවන සාමාන්‍ය මුදල සහ ඒ මගින් ලැබිය හැකි සාමාන්‍ය ආදායම අංක 4 දරන වගුව මගින් දක්වා ඇත.

4 වගුව

අධ්‍යයන ප්‍රදේශයේ වී සංඛ්‍යාති (යල/ මහ)

| වගා කන්නය | යල[10] | මහ[11] | සාමාන්‍ය[12] |
|---|---|---|---|
| මුළු වියදම (රුපියල්)[6] | 37,500 | 37,500 | 37,500 |
| මුළු ආදායම (රුපියල්)[7] | 62,370 | 68,310 | 65,340 |
| දළ ලාභය (රුපියල්)[8] | 24,870 | 30,810 | 27,840 |
| සම්මත අපගමනය (හෙක් 1ට කිලෝ) | 307 | 809 | 558 |
| සම්මත දෝෂය (හෙක්.1 කිලෝ) | 797 | 852 | 824.2 |
| ලාභයේ 95% විශ්වාස සීමා[9] | (23,589 - 26,151) | (29,44 1- 32179) | (26,515 - 29,165) |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත 2002

---

[6] බීජ සැකසීම, බිජ, පොහොර, කෘමිනාශක, වල්නාශක, ශ්‍රමිකයින්, ට්‍රැක්ටර්, ප්‍රවාහන, ... සහ වෙනත් වියදම්

[7] වී බුසල් 1- කි.ග්‍රෑම් 22, වී කිලෝග්‍රෑම් 1ක සාමාන්‍ය ගැනුම් මිල රු. 13.50 (වී බුසලකට ඇති කි.ග්‍රෑ 550 x රු. 13.50)

[8] වෙළඳ පරිභෝජනය කරන ලද ප්‍රමාණය සහ ගණනය කරන ලද ප්‍රමාණයේ වෙනස සැලකිල්ලට ගෙන ඇත.

[9] විශ්වාස සීමා ගණනය කරන ලද්දේ $\overline{X} - Z_{\alpha/2}\delta/\sqrt{n}, \overline{X} + Z_{\alpha/2}\delta/\sqrt{n}$ සූත්‍රය අනුවය

[10] යල කන්නයේ සාමාන්‍ය වී නිෂ්පාදනය හෙක්. 1- වී බුසල් 210

[11] මහ කන්නයේ සාමාන්‍ය වී නිෂ්පාදනය හෙක්. 1- වී බුසල් 230

[12] වාර්ෂික දළ ලාභය (යල සහ මහ කන්නවල මුළු ලාභය 55,680/12 (මාසයකට) ඇති ආදා / 5.8 (පවුලක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව)= රු. 800.00

මේ අනුව එක් කන්නයක දී ගොවියකු විසින් හෙක්ටයාර් 1 ක වී වගාවෙන් ලද හැකි දළ ලාභය රුපියල් 27,840.00 කි. එම මධ්‍යය අගයේ සම්මත අපගමනය 558 වන අතර සම්මත දෝෂ ප්‍රමාණය ද ඉහල අගයක් ගෙන තිබේ. "සී" කලාපය පුරා ඒකාකාරී වී නිෂ්පාදන විභවතාවයක් නො පැවතීම ඊට හේතුව යි. මේ තත්ත්වය මත වසරක දී එක් ගොවි පවුලක සාමාන්‍ය ආදායම රුපියල් 55,680.00 ක් (යල සහ මහ යන කන්න දෙක සඳහා ) පමණ වෙයි. ප්‍රදේශයේ ගොවි පවුලක සාමාජිකයන්ගේ සාමාන්‍යය 6 ක් (5.8) වන අතර ඒ අනුව එක් අයෙකුගේ මාසික සාමාන්‍ය ආදායම රුපියල් 800.00 ක් පමණ වෙයි.

සෑම ජානපදිකයෙකුට ම ඉඩම් ලාභියෙක් ලෙසට දැක්විය හැකිමුත්, ඔවුන්ගේ දෙවන පරම්පරාව එලෙස දැක්වීමට අසීරු ය. බොහෝවිට ඔවුන් තම දෙමාපියන් සමඟ හෝ දෙමාපියන්ට අයත් ඉඩමේ කොටසක පදිංචි වී ඇත. ඔවුන්ගෙන් 58% අඳයට හෝ බද්දට කුඹුරු වගා කරයි. මෙ තත්ත්වය ඔවුන්ගේ ආර්ථිකය කෙරේ සෘජුව ම බලපා ඇත. මෙම අධ්‍යයනයට අනුව කලාපයේ සේවා වියුක්තිය 33% ක් තරම් ඉහළ මට්ටමක පවතී. රැකියා විරහිත, ඉඩම් අහිමි දෙවන පරම්පරාවේ සාමාජිකයන් කුලී ශ්‍රමිකයන් ලෙසට ද සේවය කරන අතර, ඇතැමෙක් රැකියා සොයා කලාපයෙන් පිටතට සංක්‍රමණය වී ඇත.

මේ අධ්‍යයනයෙන් පැහැදිලි වන මූලික කරුණක් වන්නේ ජානපදිකයින්ගේ ඉපයීම් ඉතාමත් පහළ මට්ටමක පැවතීම යි. අඩු ආදායම ක්‍රය ශක්තිය හීන කිරීමට බලපායි. එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමට අපොහොසත් වන්නා, නිතැතින් ම මුදල් සම්පාදනය කරගැනීම සඳහා විකල්ප මාර්ග කෙරේ යොමු වෙයි. ඒ අතුරින් ප්‍රමුඛ වන්නේ මුදල් ණයට ගැනීම යි. අධ්‍යයනයට අනුව නියැදියෙන් 52%ක් ආයතනික හෝ ආයතනික නොවන අංශයෙන් ණය ලබාගෙන ඇති අතර ඉන් 28%ක් පමණ තවමත් ගෙවා නොමැත. මේ තත්ත්වය ග්‍රාමීය ණයගැතිභාවය තීව්‍ර කිරීමට හේතු වී තිබේ. සේවා මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාවය සඳහා සිදුකෙරෙන

ජානපදිකයින්ගේ දායකත්වය මන්දගාමී කිරීමට ද මෙයි සාධක හේතු වී ඇති බැව් පෙනේ.

**වෙළඳපොළ සාධක**

ජානපදිකයින්ට සේවා සපයන තොග, සිල්ලර වෙළඳසැල් සහ සති පොළවල ක්‍රියාකාරීත්වය ඇසුරින් වෙළඳපොළ තත්ත්වය පිළිබඳ ව අධ්‍යයනය කළ හැකි වෙයි. සැළසුම්වලට අනුව නිර්මාණය කරන ලද ජනාවාස රටාවේ කුඩා ගම්මානවල සිට නගර මධ්‍යස්ථාන දක්වා ප්‍රශස්ත ජන සංඛ්‍යාවට අනුව සේවාවන් සැපයීමට ක්‍රියා කොට තිබේ. ඒ බැව් දෙවන සහ තෙවන උප කලාපවල සේවා මධ්‍යස්ථාන දැක්වෙන අංක 2 සහ 3 දරන සටහන මගින් පැහැදිලි කෙරේ. එක් එක් තරාවන් යටතේ නිර්මාණය කොට ඇති ජනාවාස ධූරාවලීන් අනුව සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය ඛණ්ඩන ක්‍රමය (Bisection method) අනුව අංක 4 දරන සටහනේ දක්වා ඇත. විවිධ ධූරාවලින් යටතේ පවතින සේවා මධ්‍යස්ථානවල පැවැත්මට නියමිත වූ වෙළඳාම ප්‍රමාණයක් පැවතීම අත්‍යවශ්‍යය වෙයි. එහෙත් සැළසුම්වලින් බලාපොරොත්තු නො වූ, ඇතැම් සේවාවන් ලබා ගැනීමට ළඟින් පිහිටි නගර මධ්‍යස්ථානයට වඩා දුරින් පිහිටි මහියංගනය නගරය කරා ජානපදිකයින් යොමු වී ඇති බව පෙනේ. අංක 5 දරන පරිමාණ සටහන (Scalologam) මගින් සේවා මධ්‍යස්ථානවල පවත්නා සේවා පහසුකම් හා ඒවා ලබා ගැනීමට ජානපදිකයින් ගමන් කළ යුතු දුරත් ප්‍රස්තාරානුකූල ව දක්වා ඇත.

සිල්ලර සහ තොග වෙළඳසැල්වලට වඩා ජානපදිකයින්ගේ කෘෂි නිෂ්පාදිත අලෙවි කර ගැනීමටත් ඔවුනොවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමටත් වැදගත් වන අංගයක් ලෙසට සති පොළ දැක්විය හැකි ය. දෙවන හා තෙවන උප කලාපවල මැදගම (අඟහරුවාදා) සහ ගිරාඳුරුකෝට්ටේ (සිකුරාදා) සති පොළවල් පවත්වාගෙන යයි. තෙවන උප කලාපයේ වයඹ දිගින් පිහිටා ඇති ගම්මානවල ජානපදිකයින්ට ද සමීප සති පොළ මධ්‍යස්ථානයක් වන ගිරාඳුරුකෝට්ටේ නගරයට වඩා දුරින් පිහිටි මහියංගනය සති පොළ වෙත යොමුවීම විශේෂ

ලක්ෂණයකි. ඒ සඳහා ජානපදිකයින් දක්වා ඇති හේතු මෙලෙස සංක්ෂිප්ත කළ හැකි ය.

1. මහියංගනය දක්වා හොඳ ප්‍රවාහන සේවයක් පැවතීම.
2. සතියේ නිවාඩු දිනයක (ඉරිදා) මහියංගනය පොළ පැවැත්වීම.
3. ගිරාඳුරුකෝට්ටේ පොළට වඩා මහියංගනය පොළේ භාණ්ඩ රාශියක් පැවැතීම.
4. ගිරාඳුරුකෝට්ටේ පොළට සාපේක්ෂ ව මහියංගනය පොළේ භාණ්ඩ මිල ගණන් අඩු යැයි සැලකීම.

මෙහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ, ගිරාඳුරුකෝට්ටේ නගරය නැමති ධ්‍රැවය කෙරේ ජනයා ප්‍රවේශ වීම නොව, වෙනත් ධ්‍රැවයක් කරා ඔවුන් යොමුවීම යි. මේ තත්ත්වය ගිරාඳුරුකෝට්ටේ නගරය තරමක් ජනයාගෙන් තොර පාළු ස්වරූපයක් ගැනීමට හේතු වී ඇත.

5. වගුව ගිරාඳුරුකෝට්ටේ නගරයේ කාර්යමය සංයුතිය.

| භාණ්ඩය | වෙළඳසැල් ප්‍රමාණය | නියදියේ ප්‍රමාණය |
|---|---|---|
| 1 සිල්ලර / තොග වෙළඳාම | 12 | 3 |
| 2 කෘෂිද්‍රව්‍ය අලෙවිසැල් | 11 | 3 |
| 3 ආපන ශාලා | 5 | 2 |
| 4 සාප්පු (රෙදි) | 8 | 1 |
| 5 ගොඩනැගිලි ද්‍රව්‍ය / ගෘහ උපකරණ | 7 | 1 |
| 6 වෙනත් | 9 | 2 |
| එකතුව | 52 | 12 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත.

අධ්‍යයනය සිදුකෙරෙන කාල පරිච්ඡේදයේ දී ගිරාඳුරුකෝට්ටේ නගරයේ වෙළඳසැල් 52 ක් විවෘත ව පැවතිණි. ඒවායේ කාර්යමය සංයුතිය වගුව 5 මගින් දැක්වෙයි. වෙළඳසැල්වල ඇති භාණ්ඩ වර්ග, ඒවායේ

ප්‍රමාණය සහ වෙළඳාම් එකිනෙකට වෙනස් තත්වයේ පවතී. වෙළ|සැල්වලින් 50% පමණ දෛනික ආදායම රුපියල් 1000 කට අඩු වන අතර, එකී කාණ්ඩයට පත් පැන් හල්, සැලුන්, බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථාන වැනි ඒවා අයත් වෙයි. දෛනික ආදායම රුපියල් 1001 ත් 5000 ත් අතර ආදායම ලබන වෙළඳසැල් 33% ක් පමණ පවතී. ඒවාට තොග, සිල්ලර වෙළඳාම්, රෙදිපිළි සහ එළවළු වෙළඳාමත් අයත් වෙයි. රුපියල් 5001 ට වැඩි දෛනික ආදායම් ලබන වෙළඳසැල් 17% පමණ පවතී. තොග වෙළඳාම්, කෘෂිද්‍රව්‍ය අලෙවිහල් එකී කාණ්ඩයට අයත් වෙයි. කෙසේ වෙතත් නගරයේ වෙළඳසැල් හිමියන්ගෙන් බහුතරයකගේ අදහස වී ඇත්තේ, තම ව්‍යාපාර කටයුතු තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා පවත්නා ඉඩ ප්‍රස්තා විරල බව යි. ඒ සඳහා හේතු වී ඇත්තේ භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමට නගරයට පැමිණෙන්නන්ගේ ප්‍රමාණය අඩු වෙමින් පැවතීම යි. ඊට බලපා ඇති හේතු සංක්ෂිප්ත ව මෙලෙස දැක්විය හැකි ය.

1. ගිරාඳුරුකෝට්ටේ නගර මධ්‍යස්ථානය ආසන්න ව පදිංචිව සිටින ජන සංඛ්‍යාව අප්‍රමාණවත් වීම (නගරය තුළ ජනාවාස නොවූ විශාල ගොවිපළක් පැවතීම).
2. ගිරාඳුරුකෝට්ටේ නගරයට වඩා මහියංගනය සහ දෙහිඅත්තකණ්ඩිය වැනි වර්ධන කේන්ද්‍ර දෙකක් පැවතීම නිසා ජනයා ඒවා කෙරෙහි යොමුවීම.
3. ප්‍රධාන මාර්ගයෙන් පිටස්තර ව ගිරාඳුරුකෝට්ටේ නගරය පිහිටා තිබීම නිසා, බොහෝ රථවාහන නගරයට ඇතුළු නො වීම.
4. ගිරාඳුරුකෝට්ටේ වෙත පැමිණෙන ප්‍රවාහන සේවාවල දුර්වලතා
5. නගරය තුළ සිනමා ශාලා වැනි වෙනත් විනෝදාස්වාද ලබාදෙන ආයතන නො පැවතීම.

ගිරාඳුරුකෝට්ටේ නගරය කෘෂිද්‍රව්‍ය මිල දී ගැනීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ඉටුකරන කාර්යභාරය පිළිබඳ ව සෑහීමකට පත්විය නො හැකි බැව් ප්‍රාදේශිකයෝ ප්‍රකාශකර සිටිති. අධ්‍යයනයට අදාළ කර ගන්නා ලද ගොවීන්ගෙන් ගිරාඳුරුකෝට්ටේ නගරයේ ඇති වෙළඳසැල්වලට වී අලෙවි කොට ඇත්තේ 1% කට ආසන්න ගොවීන් ප්‍රමාණයකි.

කලාපය තුළ බොහෝවිට වී මිල දී ගැනීම සිදුවන්නේ මුදල් සහ භාණ්ඩ ණය වශයෙන් ලබාදෙන්නන් සහ ජංගම වෙළෙඳුන් විසින්. මොවුන් වී මිලදී ගැනීමේ දී ප්‍රමිති පිළිබඳ ව නො සැලකීමත්, කුඹුරට ම පැමිණ වී මිලදී ගැනීමත් නිසා ගොවීන් අතර ඔවුන් ජනප්‍රිය ව ඇත. සිල්ලර වෙළෙඳුන් සමග නිරන්තර ව ගනුදෙනු කරන ගොවීන් විසින් ලබාගන්නා වූ භාණ්ඩවලට බොහෝවිට ගොවීන් කරනුයේ තම අස්වැන්න ඔවුනට ම අලෙවි කිරීමේ ප්‍රතිපත්තියකි. මේ තත්ත්වය මත ගොවීන්ගේ නිෂ්පාදනවලට නියම මිලක් ලැබේදැයි සැක සහිත ය.

ප්‍රවාහන සාධක

සේවා මධ්‍යස්ථාන සාර්ථක ව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන මූලිකාංගයක් වන්නේ, ඒවා අවට ජනයාට, එකී සේවාවන් ලබා ගැනීම පිණිස ප්‍රවේශවීමට සුදුසු ප්‍රවාහන සේවාවන් පැවතීම යි. මෙය පෞද්ගලික, පොදු හෝ රජය මගින් පවත්වාගෙන යන සේවාවන් වීමට පිළිවන. වගුව අංක 6 ට අනුව, න්‍යායාත්මක වශයෙන් ධූරාවලියේ නගර මධ්‍යස්ථානයක් වන ගිරාඳුරුකෝට්ටේ නගරය මගින් දෙවන සහ තෙවන උප කලාපවල පවත්නා සියලු ම මධ්‍යස්ථාන පාලනය විය යුතු ය. ඒ අනුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන 3 ක් ද, ගම් මධ්‍යස්ථාන 6 ක් ද, කුඩා ගම්මාන 19 ක් ද, පාලනය විය යුතු ය.

6. වගුව

දෙවන සහ තෙවන උප කලාපවල සේවා මධ්‍යස්ථාන ධූරාවලිය සහ ඉන් පාලනය විය යුතු වෙළඳපළ ප්‍රදේශ

| ධූරාවලිය | ඉහළ මට්ටමේ මධ්‍යස්ථාන විසින් සේවා සපයන කේන්ද්‍රස්ථාන ප්‍රමාණය | ඉහළ මට්ටමේ මධ්‍යස්ථාන විසින් සේවා සපයන වෙළඳපොළ ප්‍රමාණය |
|---|---|---|
| නගර මධ්‍යස්ථාන | 1 | 1 |
| ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 3 | 4 |
| ගම් මධ්‍යස්ථාන | 6 | 10 |
| කුඩා ගම්මාන | 19 | 29 |

සියලු ම ධූරාවලින් සම්බන්ධ කරමින් වඩා හොඳ මාර්ග ජාලයක් දෙවන සහ තෙවන උප කලාප තුළ දැකිමට පුළුවන. එහෙත් පවත්නා ප්‍රවාහන පහසුකම් ජනපදිකයින්ගේ අවශ්‍යතා සැපිරීමට සමත් වී නැත. නිදසුනක් ලෙසට ගතහොත් මේ කලාපයේ ජනතාව වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා යොමු වී ඇති ස්ථාන අනුව ඒ බැව් පැහැදිලි කළ හැකි ය. මේ වනවිට මහියංගනය, දෙහිඅත්තකණ්ඩිය සහ ගිරාඳුරුකෝට්ටේ රජයේ රෝහල්වලින් සැපයෙන වෛද්‍ය සේවාවන් සමාන මට්ටමකින් පවතින බැව් ජනපදිකයන් විසින් පිළිගන්නා මුත් ඔවුන් සේවා ලබාගන්නා සේවා ලබාගන්නා ස්ථානයේ වෙනස්කම් අංක 6 දරන සටහනින් මනා ව පිළිබිඹු කෙරේ. ඒ අනුව ඔවුන්ට ළඟින් ම පිහිටි ගිරාඳුරුකෝට්ටේ රෝහල වෙත නො ගොස් වෙනත් රෝහල් කරා ගොස් වෛද්‍ය පහසුකම් ලබාගැනීමට යොමු වී ඇති බැව් පෙනේ. ඊට බලපා ඇති ප්‍රධාන හේතුව වන්නේ ගිරාඳුරුකෝට්ටේ නගරය කරා ප්‍රවේශ වීමට ක්‍රමවත් සහ හොඳ ප්‍රවාහන සේවයක් නො පැවතීම යි. මේ වනවිට ගිරාඳුරුකෝට්ටේ හරහා ප්‍රධාන මාර්ගයේ දිවෙන (දෙහිඅත්තකණ්ඩිය සහ මහියංගනය මාර්ගය) ප්‍රවාහන සේවා සතුටුදායක අන්දමින් පැවතුන ද, අවට පිහිටි ප්‍රාදේශීය

මධ්‍යස්ථාන හා කුඩා ගම්මාන යාකරමින් පවතින ප්‍රවාහන ජාලය ඉතාමත් දුර්වල මට්ටමක පවතී. එහෙත් කෙල්දෙනියාය, ගල්පොරුයාය, දිවුලපැලැස්ස, රොටලාවල, කෙම්බරාව වැනි ගම්මාන ඔස්සේ තරමක් සතුටුදායක ප්‍රවාහන සේවාවක් මහියංගනය දක්වා පවතී. මේ තත්වය, එකී ගම්මානවල වැසියන් පවා ගිරාඳුරුකෝට්ටේ නගරය වෙත නො ගොස් මහියංගනය නගරය කරා යොමු කිරීමට හේතු වී තිබේ. කෙසේ වෙතත් ජානපදිකයින්ගේ අදහස වන්නේ ගිරාඳුරුකෝට්ටේ නගරය හා සම්බන්ධ කරමින් සතුටුදායක ප්‍රවාහන සේවයක් පවතිනම් මේ තත්ත්වය වෙනස් විය හැකි බව යි.

## නිගමනය

කුඩවක් වර්ධන ධ්‍රැවයක් (Growth Centre) ලෙසට ගිරාඳුරුකෝට්ටේ නගරය ක්‍රියත්මක නොවන බැව් මේ අධ්‍යයනය මගින් හෙළිදරව් වී ඇත. එසේ වීමට බලපා ඇත්තේ, ගම සහ නගරය (හර සහ ප්‍රත්‍යන්ත ප්‍රදේශ) අතර සබඳතාව අවම මට්ටමක පැවතීම යි (ධර්මසිරි 1985). ඒ අනුව ගිරාඳුරුකෝට්ටේ නගර මධ්‍යස්ථානය ස්ථානගත කිරීම කොතෙක් දුරට නිවැරදි වන්නේ දැයි නැවත වරක් සිතා බැලිය යුතු ය. සැලසුම් සැකසීමේ දී න්‍යායාත්මක කරුණුවලට අනුරූප ව නගරය නිවැරදි ව ස්ථානගතකර ඇතත්, ප්‍රායෝගික ව ගත් කළ එහි ඇති අසංවිධිත බව හා අයෝග්‍ය භාවය මනා ව පැහැදිලි කෙරේ, මේ තත්ත්වයට අනුරූප ව, සැලසුම් සැකසීමේ දී න්‍යායාත්මක කරුණු කෙරේ. පමණක් අවධානය යොමු කිරීම නුසුදුසු බවත්, ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනාගෙන, ඔවුනගේ රුචි අරුචි කම්වලට අනුව විධිමත් අයුරින් සැලසුම් සැකසීමේ අවශ්‍යතාව පැහැදිලි කෙරේ.

කෙසේ වෙතත් කාර්යක්ෂම සේවා මධ්‍යස්ථානයක් ලෙසට නගරය පවත්වාගෙන යාම සඳහා වැදගත්විය හැකි යෝජනා කිහිපයක් දැක්වීමට පිළිවන. ජනතාවගේ ආදායම් නංවාලීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ඉතා වැදගත් කොට සැලකේ. ඒ සඳහා බදු සහන සැලසීම, ගොවි සංවිධානවල

ශක්තිය වැඩිකිරීම වැදගත් විය හැකි ය. වී වගාව ආරම්භයේ පටන් අස්වනු අලෙවිය දක්වා, කටයුතු රාජ්‍ය යාන්ත්‍රණයේ අධීක්ෂණය යටතේ ගොවි සංවිධානවල පූර්ණ දායකත්වය යටතේ සිදු කිරීම වැදගත් වෙයි. එමගින් මහා පරිමාණික ලෙස කෘෂි යෙදවුම් මිලදී ගැනීමටත්, තොගවල් කිරීම මගින් කෘෂි නිෂ්පාදනවලට ඉහළ මිලක් ලබාගැනීමටත් අවස්ථාව පැවතිය හැකි ය. වී වගාවට අතිරේක ව, වඩාත් ඵලදායි ආර්ථික බෝගයන් වන, වාණිජ්‍ය බෝග නිෂ්පාදනය කෙරෙහි ගොවීන්ගේ අවධානය යොමුකිරීම ද ඉතා වැදගත් වෙයි. කෘෂිකර්මාන්තය පදනම් කොටගත් කර්මාන්තපුරයක් ඇරඹීම, කලාපය පුරා ක්‍රමවත් ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම, නගරය තුළ ඇති ගොවිපළෙන් කොටසක් ජනාවාසකරණයට ලක්කිරීම, නගර සැලසුම නැවත සකසීම වැනි ඒවා නගරය කාර්යක්ෂම ව පවත්වාගෙන යාම සඳහා ප්‍රයෝජනවත් විය හැකි ප්‍රධාන යෝජනාවක් ලෙසට දැක්විය හැකි ය. එසේ නැතහොත්, ගිරාඳුරුකෝට්ටේ නගරය කෙරෙහි තවදුරටත් අවධානය යොමු නො කර, මහියංගනය, දෙහිඅත්තකණ්ඩිය වැනි නගරවල වර්ධනයට තවදුරටත් ඉඩදීමෙන් ගිරාඳුරුකෝට්ටේ නගර මධ්‍යස්ථානය ප්‍රාදේශීය නගර මධ්‍යස්ථානයක් බවට පත්වීමට ඉඩහැරීමට සිදුවෙත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ධර්මසිරි, ආර් ජේ. එල්. එම්. 1995. *සැලසුම්ගත ජනාවාසයක සේවා පහසුකම් ස්ථානගතවීම මහවැලි "සී" කලාපයේ දෙවන සහ තෙවන උප කලාප ඇසුරෙන් අධ්‍යයනයක්,* විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරන ලද අප්‍රකාශිත පර්යේෂණ වාර්තාවකි.

මහවැලි සංවර්ධන අමාත්‍යාංශය. 1983. *මහවැලි ව්‍යාපාර සහ අරමුණු,* ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රවෘත්ති සේවයේ ප්‍රකාශනයකි.

1988. *මහවැලි ව්‍යාපාර සහ අරමුණු,* ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රවෘත්ති සේවයේ ප්‍රකාශනයකි.

1993. මහවැලි ගඟ, සංවර්ධන ව්‍යාපාරය, ප්‍රගතිය, ප්‍රශ්ණය සහ ප්‍රබෝධය, මහවැලි ඉංජිනේරු සහ නිර්මාණ ආයතනයේ ප්‍රකාශනයකි.

Berry. Brain. J.L., Edgar Conkling and Michael Ray. 1976. *The Geography of Economic System*, Lodon: International Prentige Hall.

Berry. Brain J.L.1967. *Geography of Marcket Centres and Retail Distribution*, Foundation of Economic Geography Series, England wood.

Hagget Peter. 1979. *Geography-Modern Synthesis*,(3rd Edition) London: Harper and Raw Publisher.


Mahaweli Authority of Sri Lanka. *1980. Implementation Plan for Zone 2 of System'C'*.


M.D.B. and Sogreach .1972. *Mahaweli Ganga Development Project*-Feasibility study for stage 11:vol:v11 and vlll.


Mendis. M.W.J.G.1973. *The Planing implication of Mahaweli Development in Sri Lanka*, Colombo : Lake House publishes.


Morgan, W.B. and Plugh,L.C.1971. *Agricultural Geography*. Menthunen and Co. Ltd.

## උප ග්‍රන්ථය











3 සිතියම





4 සටහන




මූලාශ්‍රය: Pradipto Roy and Patil, B.R., 1977. Manual for Block Level Planning. The Macmillan Company of India Ltd., pp. 23-29.


0
20
40
60
80
100%
25
20
15
10
5
0


0
20
40
60
80
100%
25
20
15
10
5
0


0
20
40
60
80
100%
25
20
15
10
5
0

